## පලාකොල ලේඛනය.

| | | |
|---|---|---|
| 1 | පැතිතෝර කොල | ආමවාත, කාස, පනුරෝග කැසීම්, සවාස, දද, කුෂ්ට නසයි. බරයි; මෙය සාමාන්‍ය පිලිවෙලට උයන්ඩ පුලුවන. |
| 2 | පෙති තෝර කොල | තිදෙස නසයි, සියම් ඇඹුලයි. විශේෂ වාසෙම් නසයි. කැසීම්, කැස්ස, පනුරෝග, සවාස දද කුෂ්ට, නසයි. සාමාන්‍ය පිළිවෙලට මලවන්ඩ පුලුවන. |
| 3 | පිළිහුඩු පලා | තනකිරි වඩයි, මිහිරියි, ශුක්‍රධාතුව වඩයි, සාමාන්‍ය පිළිවෙලට මලවන්ඩ පුලුවන. |
| 4 | පතෝල කොල | පිත නසයි ගිණි පැසවයි, තරකරයි, උණ, කාස, පණු දෙස් නසයි සැහැල්ලුයි, සාමාන්‍ය පිළිවෙලට මල වන්ඩ පුලුවන |
| 5 | රතුතම්පලා | පණුවන් නසයි, නුවන හා ගින්නද වීයර්ද වඩයි, සැහැල්ලුයි, සමාන්‍ය පිළිවෙලට උයනවා. |
| 6 | රාබු කොල | පැසීම කරයි, සැහැල්ලුයි, රුචිකරයි, උෂ්නයි. උයන්ඩ සහ මලවන්ඩ පුලුවන. |
| 7 | සුදුතම්පලා | පැසීමෙහි සැහැල්ලුයි, පනුවන් නසයි, නුවන හා අග් නියද, වීයර්ද වඩයි උයන්ඩ සහ මලවන්ඩ පුළුවන. |
| 8 | කුරතම්පලා | මිහිරියි, ශීතයි, මලබඩකරයි. පිත නසයි, වාතය, සෙම, වඩයි, බරයි, රත්පිත නසයි, විෂමාග්නීය දිනයි. උය න්ඩ සහ මලවන්ඩ පුළුවන. |
| 9 | කතුරු මුරුන්ගා කොල | පිත සහ සෙම නසයි, රලුයි. වාතය වඩයි, තිත්තයි, ප්‍රතිශ්‍යා නසයි, මලවන්ඩ පුලුවන. |
| 10 | කොහිල කොල | පිත් වඩයි, බරයි, මලබඩකරයි, සිහිල්වෙයි. දලු උය න්ඩ පුළුවන. |
| 11 | ලූනු කොල | මිහිරියි, සෙම වඩයි, වාතය නසයි, බරයි, බල වියර් වඩයි, උයන්ඩ පුළුවන. |
| 12 | තුඹ කොල | සෙමින් උපන් අශීස් නසයි, කාමල රෝගයද, පනු වන්ද, සෝඵයද දිනයි. උයන්ඩ පුළුවන. |
| 13 | තණපලා | බරයි, තරකරයි, තනීකිරි වඩයි, සෙම් වඩයි, ගිනි නසයි දුවිල්ල නසයි, මලවන්ඩ පුළුවන. |
| 14 | බතල කොල | සීතලයි. ගිණි නසයි, සෙම් වඩයි, මල බිඳියි, මේදස් වඩයි, උයන්ඩ සහ මලවන්ඩද තම්බන්ඩද පුළුවන. |
| 15 | බණ්ඩක්කා කොල | ශීතලයි, බරයි, ගිණි නසයි, පිත් නසයි, තරකරයි, හෘදයට හිතයි, සෙම් වඩයි. උයන්ඩ පුළුවන. |
| 16 | සාරණ කොල | උෂ්ණයි, වියර්යි, මල පහකෙරේ, රස ධාතුව වඩයි, සෙමද, වාතයද, ආමයද, අශීස්ද, විෂ ද ඉදුමුමද, නසන් නේය. උයන්ඩද පුළුවන. |
| 17 | වම්බොටු කොල | මිහිරියි, තියුණුයි, උෂ්ණයි, ගිණි වඩයි, සැහැල්ලුයි ශුක්‍රධාතු වඩයි, උයන්ඩ සහ මලවන්ඩ පුළුවන. |
| 18 | වැටකොලු කොල | සෙම හා අශීස් නසයි, පක්වාස ආමාශ දෙක ශුඩකරයි මලවන්ඩ පුලුවන. |

| | | |
|---|---|---|
| 19 | වට්ටක්කා කොළ | හෘදය ශුඩකරයි, ගිණි නසයි, මල බඳියි, වනවලට හිතයි, විෂ නසයි. දලු උයන්ඩ සහ කොළ මලවන්ඩ පුලුවන. |
| 20 | දියහබරල කොළ | ගිණි මඳකරයි, ප්‍රමේහයට හිතයි, දූහ නසයි, සෙම මේදස් වඩයි, තරකරයි. උයන්ඩ සහ මලවන්ඩ පුලුවන |
| 21 | හින්ගෙඳ කෙළ | ඇඹුල් ලුනුරසයි, ගිණි බඳියි, ශීතලයි, දූවිල්ල නසයි, සෙම වඩයි, ශුක්‍රධාතුව වඩයි, පිච්චුනාට හිතයි. උයන්ඩ පුලුවන. |
| 22 | එරබදු කොළ | වාතය, සෙමය, ඉදුමුමය, ප්‍රමේහය, පනුවන්ය යන මොවුන් දිනයි. තම්බා දියහැර දලු උයන්ඩ සහ කොළ මලවන්ඩ පුලුවන. |
| 23 | කැබැල්ල දලු | ගිණි වඩයි, මල බඳියි, මඳ උණුසුමයි, වන නසයි, කැපීමට සහ ලේ නැවතීමට හිතයි, තම්බා දියහැර උයන්ඩ පුලුවන. |
| 24 | ඇත්තෝර කොළ | සැහැල්ලුයි, මිහිරියි, රලුයි, වාතය, පිත සෙම, නසයි, රුචිකාරයි, ස්වාස, කුෂ්ට, දද, පනුවන් හා විෂ නසයි. විශෙෂයෙන් විරේචනය කෙරේ. මලවන්ඩ පුලුවන. |
| 25 | මැල්ල කොළ | අශීස් නසයි, කෘමි පනුරෝග නසයි, වාතය නසයි, ගිණි වඩයි. මලවන්ඩ සහ බදින්ඩ පුලුවන. |
| 26 | ඇහැල කොළ | බරයි, මිහිරියි, ශීතලයි, උන, හෘදයේ රෝග, පිත, වමනය, ඉදුම්ම, ජයගනී. විරේචනය කෙරේ. තම්බා දිය හැර උයන්ඩ පුලුවන. |
| 27 | මුරුන්ගා කොළ | කුලුයි, තියුණුයි, සෝථය ගෙඩිය රුජාය, යන මේවා නසයි. මලවන්ඩ පුලුවන. |
| 28 | රණවරු කොළ | මේහ නසයි, බරයි, ගිණි මඳකරයි, ලේ පිත් සමකරයි, දූවිල්ල පිපාසය නසයි මලවන්ඩ පුලුවන. |
| 29 | අබ කොළ | කටදයි, මලමුත්‍ර ශුඩකරයි, පැසීම කරයි, උෂ්ණයි, රළුයි, තිදොස් දිනයි. උයන්ඩ පුලුවන. |
| 30 | නිවිති කොළ | ශීතලයි, සිනිඳුයි, සෙම් වඩයි, පිත නැතිකරයි, කණ්ඨය මෘදුකරයි, නිදිකරයි, ශුක්‍රධාතුව වඩයි, රත්පිත් සමකරයි, මලබඳියි, ප්‍රියකරයි, තරකරයි. උයන්ඩ පුලුවන |
| 31 | කරපිංචා කොළ | රුචිකරයි, වාතය වඩයි, සෙම් සෝත නස( ), බල වඩයි මේදස් ලේ, දොස්පි නසයි. උයන්ඩ සහ මලවන්ඩ පුලුවන. |
| 32 | ඇඹුල ඇඹිලිය | බඩගිණි වඩයි, රුචිකරයි, රලු, උණුසුම් සෙම්වා නසයි පිත් වඩයි, ඇඹුල් රසයි, ග්‍රහණී, අශීස්, කුෂ්ඨ රෝග නසයි. |

මෙහි නො. 1, 8, 10, 11, 13, 15, 26, 28, ඉක්මනින් නොදිරන වර්ගවේ.
„ 4, 5, 6, 7, 17, 24. ඉක්මනින් දිරවන වර්ගවේ.
„ 7, 16, 17, 23, 29, 32, උෂ්ණ වර්ගවේ.
„ 8, 10, 14, 15, 20, 21, 26, 30, ශීතල වර්ගවේ.
„ 8, 9, 31, වාතය වඩන වර්ගවේ.
„ 2, 11, 16, 22, 24, 25, 32, වාතය නසන වර්ගවේ.